## බුවාලන්තය

# ‘බිල් ලාඩිං’ ගේ ගෙදරට හොරු පැනලා!

**සත්‍ය බේගලක් ඇසුරින් ලිව්වේ තිස්ස කුමාර කරුණාසේකර**

බුවා නිවසේ දැහැමෙන් සෙමෙන් වෙසෙන විට මූණ දුන් සොඳුරු සොර අත්දැකීම පසුගිය සතියේ එවූ වාර්තාවෙන් කියවන්නට ඇතැයි සිතමි.

නිවසේ බාගෙට ඇර තිබූ ජනේලයකින් එන්ටර් ද ඩ්‍රැගන් වූ සොර බුවෙකු විසින් නිවසේ සිටි මාත්, අයියාත්, අක්කාත් හයිජැක් කළ අතර රත්භාණ්ඩ පිළිබඳ විමසීමේදී බුවා අයියාත් බූවී අක්කාත් අතර ඇතිවූ ගෝල්ඩන් වෝ එකට සොර බුවාටත් තද වුණා.

‘අම්මපා කට වැහුවේ නැත්තං.. ඔය කට වැහෙන්න අලවනවා ප්ලාස්ටර්...”

“අලවයි ප්ලාස්ටර්. ප්ලාස්ටර් කැල්ලක් තියා පුළුං පොදක්වත් ගේ හරියෙ නෑ. කොච්චර කියලා ඇද්ද මේ මනුස්සයාට හදිසියකදී ලෙඩකට තුවාලෙකට ඕනෑවෙන බේත් දලා තියන්න ‘ෆස්ට් ඒඩ්ස්’ බොක්ස් එකක් ගේන්න කියලා.

“ෆ්ස්ට් ඒඩ් බොක්ස් මොකටද ඔය තියෙන්නෙ ගමටම ඇහෙන්න චැටර් බොක්ස් එකක්.” අයියා ද අතරින්නේ නැත.

“මේ ඕයිලා ප්ලීස් කරලා.. ඉස්ටොප් කරනවද බර බරේ...” අතික් සොර බුවා ද එතැනට සෙට් විය.

‘මේ මචං... මුන් දන්නෙ පුල් මොත්තෙ. දෙන්නා කසිලිය ඇදගෙන වෙලාව ගත වෙනකං අපිව චාටර් කරන්නයි හදන්නෙ. ඒං මේං එළිය වැටෙන කොට අහළ පහළ එවුන් පොලිසියට ගිහිල්ලා ගමන් අපි දෙන්නා නිකංම මසාජ් ක්ලිනික්. මේ නංගී අපිව නටවනවා බොරු. අපි විනාසමුල්ලෙ බුවාලා.. අරී..?

‘ය.. යකෝ.. ඇඩ්‍රස් එකයි නම්බරෙයි ඒකත් කියපං.. සෙල් නම්බරෙත් ලියලම දීපං.. වූර්සබයා. උදේට මුං ඇන්ට්‍රිස් දපු ගමං පරිප්පු වෑන් එක උඹලෑ ගෙයි දෙරකොඩ.’

‘හ්...ම්.. එච්චායින් කාරි නෑ. කෝ කියපං බලන්ඩ උඹගේ පර්ස් එක කොහෙද කියලා...’



‘අ... අනේ.. ඒක නං අහන්ඩ එපා.. ඒක නං ගන්ඩ එපා...’

‘යකෝ... සෙල්ලං ද කොල්ලෝ... බස්සනවා බුලට් පලුවක් අග්නියාසෙට...’

හොර බුවෙක් පිස්තෝලෙ බටය අයියාගේ කටට එල්ල කළේය.

‘හ...හපෝ.. එපා මට ගැස්ට්‍රික් තියෙනවා. කරදර කරන්න එපා.. කි.. කියන්නං.. කියන්නං.. හැබැයි ගත්තට කමක් නෑ ඇතුළ බලන්න එපා...’

‘අම්මපා.. මේකෙ ඇත්ත එකක් වුණා නං.. මූට වෙඩි තියලා මං හිරේ යනවා..’ හොර බුවා පිස්තෝල කොටයට රවමින් කීවේය.

‘අයියෙ පර්ස් එක තියෙන තැන කියන්න සල්ලි වගේ ද ජීවිතේ...’ මට ඉබේටම කියැවිණි.

‘මැද කාමරේ.. ඇඳුං වැටේ.. මගේ දුඹුරු පාට කලිසමේ.. පිටිපස්සෙ සාක්කු...

‘නෑ... නෑ.. දැං එතන නෑ.. ඔයාගෙ ලාච්චුවට දැම්මා. අක්කා නිවැරැදි කිරීමක් කළාය. එවර අයියා ගේ මුහුණ අට විය.

‘සොර බුවෙක් වහා ගොස් මුදල් පසුම්බිය ගෙන ආවේය.

‘ටාර් ගාලා බලපං කීයක් තියෙනවද කියලා.”

සොර බුවා පසුම්බියෙ ඇති දේ මේසය මතට හැලුවේය.

‘ෂිකේ යකෝ.. රුපියල් හැත්තෑවයි. නමට මහත්තුරු.’ හන්දියෙ බෝගහ ළඟ හිඟන කුප්පායමට පැන්නානං මීට වැඩිය හොඳයි බං.’

‘චික්.. ඒ දවස්වල අර අම්මලා ගෙනාපු යෝජනාවට කැමති වුණා නං අද මේ වගේ.. අවච්චාඩි කතා අහන්න වෙන්නෑ... හොරෙකුට ගෙනියන්නවත් රුපියල් සීයක් නෑ පර්ස් එකේ...’ බූවී අක්කා පස්චාත්තාප විය.

“මොනාද බං ඔය හැටි කොල කෑලි. චෙක් වත්ද?’ පර්ස් එකෙං වැටුණ කොල කෑලි දුටු හොර බුවෙක් පැවසීය.

‘කෝ බලන්න.. මේ බිල් වගයක් නේ. අපතයා රෙස්ටුරන්ට් ගල් බාගයයි. ඉස්සෝ ඩෙවල් එකයි.. කඩල පීරිසියයි. ගෝලීප් හතරයි.

‘මො... මොනා.. කෝ. ඕක.. මෙහාට ටිකක් පෙන්නනවා.. හනේ අම්මපා.. ඇඩ්වාන්ස් ගත්තු සල්ලි අඩු මොකද කියලා මං හිතුවා පර්ස් එක චෙක් කරපු වෙලාවෙ... හනේ... හනේ.. ආයෙත් සෙට් වෙන්න පටන්ගත්ත ද ඇත්තමයි මේ පාර නං මං...’

‘මේ කෑගහන්න එපා.. අයිසෙ එක දවසක්.. වදෙන් බේරෙන්න බැරුව අරුත් එක්ක සෙට් වුණා...

‘එහෙනං මොකක්ද මේ පොඩි තුණ්ඩු කෑල්ල...’හොර බුවෙක් ද සංවාදයට එකතු විය.

රුසියන් රිදම්.. ගෝ. තුන රුපියල් විස්සයි.’

‘යකෝ උඹත් බේබි බුවෙක් නේ. ඔය යකෝ චිට් එකක් අස්වයෝ අල්ලන කොට බුකියෙන් දෙන චිට් එකනේ...

‘ඈ මො... මොනවා.. ඒ පාර රේසුත් දලා ද.. හොඳ වෙලාවට හොරු පැන්නේ.. පර්ස් එක හොරෙං චෙක් කෙරුවට ඔය කොල කෑලි මොනාද කියලා බැලුව නැති එකේ වරද තමයි.. අඩුවෙලා තිබුණේ එකයි. රේස් විතරයි මේ නාස්තිකාර මිනිහා දැං ඒකටත් ඇබ්බැහි වෙලා... හොරු ගියපු ගමන් මං යනවා පොලිසි...

‘මොනා පොලිසි යන්න. පොලිසි ගිහින් තිබ්බොත් පහුවදා රැට ඇවිත් බයිපාස් කරලා යනවා සිහි නැති නොකර...’ හොර බුවා බූවි අක්කාට ගෙරවීය.

එහෙම උලව්වකට නෙමෙයි ඕයි මං යන්නේ.. පොතේ ලියලා මං අපේ අම්මලගෙ දිහාවෙ යනවා ඇඳුම් ටිකත් අරං. තවත් ඉතිං ඉඳලා මොකටද බලන්න මල්ලි. එවර මටද කේන්ති ගියේය.

‘මේ... ඕයි.. තමුසෙලා හොරකං කරන්න ආවා නං තියෙන දෙයක් සුද්ද කර ගෙන මකබෑ වෙනවා. මෙතන පවුල් අවුල් නොකර...’

‘නෑ මල්ලි මෙයා හැම තිස්සෙම රුචිතෙට නේ හිතන්නේ. මේ දවසක් අර තුරග සිංහ යා හම්බවෙලා ඌ අතේ ගණං හදලා පෙන්නුවා ඔලුවට ගැහුවොත් මෙච්චරයි කකුලට ගැහුවොත් මෙච්චරයි.. කොහොම හරි කැරකිලා දපු ගාණ හරි කැපෙන විදියට ටිප් එකක් දෙන්නං විස්සම දමු කියලා.. වදෙං ගැළවෙන්ඩ විස්සක් ගැහුවා ඔලුවට.’

‘අම්මපා.. තුරගයා මට පාරෙදි හරි අහුවුණොත් ගහනවා විස්සට හතළිහක්. අස්සයගේ නෙමේ ඕකගේ ඔය කෙස් අඩු ඔලුවට...’

‘මේ මුං මෙතන මරා ගන්නාවේ බලපං ඔය ලාච්චු හෙම තවත් ඇදලා. අඩු ගානේ මාරු නොකරපු චෙක් එකක් වත් තියෙනව ද කියලා...’

හොර බුවෙක් අපව මුරට සිටි අතර අනෙකා යළිත් කාමරයේ අල්මාරි ලාච්චු පෙරළන්නට විය.

මොහොතකින් කඩදාසි කොළ මිටියක් රැගෙන විත් ඒවා පිරික්සන්නට විය.

‘මාර පොට් එකකට නේ යකෝ අපිත් පැනලා තියෙන්නේ. මේ බලපං ලයිට් බිල් ගෙවලා නෑ මාස 3 කින්. මෙතෙන්ට පොලිසියට කලිං මණ්ඩලෙං ඇවිත් ලයිට් කපනවා. මේවා.. මේ ටෙලිපෝන් බිල්... වතුර බිල්... ආ මේ මොකක්ද කලිසමක් මහන්ඩ දීලා මාස තුනකට කලිං තාම අරගෙන නෑ. යකෝ ඔක්කොම තියෙන්නෙ බිල්නෙ.. මූ නං බිල් ලාඩිං කෙනෙක්...

‘ක්... කෑගහන්ඩ එපා.. ඕයි අහළ පහළ ගෙවල් වල උන්ට ඇහෙයි. තමුසෙලා නං හොරකං කරගෙන යයි. අපි මෙතන හැමදම ඉන්ඩ එපා යෑ. උඹලා හොරු ද නැත්තං ඔඩිට්ලා ද?’

ඈ ඔය කලිසම ගන්න කියලා දවසක් ඔහෙ සල්ලි ඉල්ලං ගියා නේද? අම්මපා මටත් අමතක වුණා කලිසම ගෙනාවද බලන්න. හනේ ඇත්තට.. ඒකෙනුත් මේ මිනිහා සෙට් වෙලා. අක්කා යළිත් ඇවිළෙන්නට විය. මේ ඕයි.. තියෙන මගුලක් අරං යනවා. නැත්තං ඉන්න තැනක් කියනවා. ණයට හරි යොහලා ගෙනැත් දෙන්නං මළ වදේ. ඔය කෙහෙල් මල් ඇදලා මෙතන වණ නොකර යනවා. නැත්තං මාවත් එක්කං යනවා යන තැනක. මෙතන ගම කැවා.. වර්චස් කළා.. තමුසෙලා ගිය ගමන් මෙයා මෙතැන වඩිගපටුන නටන්ඩ ගනී...’

‘මේ මචං දැං වෙලා ගියා වැඩියි. මෙතන ඇති ඇටිකෙහෙලක් නෑ. මූනුත් එක්ක බර බරේ දලා උගුරත් කර වෙලා ගිහින් ෆ්‍රිජ් එක ඇරලා අරං වරෙන් මොනා හරි කන්ඩ බොන්ඩ.

‘ම.. මල්ලි අද නං පටි රෝලි මල්ලි...’ හොර බුවා ගිය පසු අය්යා හිමීට කියනු ඇසුනි.

සීතකරණය අරින වහන හඬ බෝතල් පෙරළෙන හඬ බඩු මුට්ටු අදින හඬ ඇසුණි.

මඳ වේලාවකින් ගිය හොරබුවා ආවේ බ්ලාස් වූ මුහුණිනි.

‘යකෝ ගෙවල් නං නිකං බංගසාල ලෙවල් එකේ. කුස්සියේ ඇන්ට්‍රි ප්‍රැන්ට්‍රි ඔක්කොම ෆ්‍රිජ් එකේ ඇති ලබ්බක් නෑ... කැරට් අල දෙකක් විතරයි තිබුණේ. උඹට එකක් ඕන ද?’

‘යකෝ... කැරට් කන්නෙ බූරුවොනෙ..’ ඈ බං.. මූ හාමතේ ද බං ඉන්නෙ. අම්මපා දන්නවා නං එන ගමන් මාර්කැට් එකෙං පලා මිටියක්වත් අරං එනවා..’

‘ඇහෙනවද කියන කතා.. මුං පොලිසියට මාට්ටු වෙච්චි දවසක මෙච්චා දිගැරියොත් අපි කොහොමද පාරේ බැහැලා යන්නෙ.. නව නිංගිරාවයි.. අක්කා හූල්ලන්නට වූවාය.

‘ඉතිං මොකෝ මට මැරෙන්ඩද කියන්නේ. එක්කෝ මුං පඩි පහුවෙලා 23, 24 දිනවත් ගෙට පනින්න ඕනෑ. මුනුත් ඉඳලා ඉඳලා ආවෙ මහ නස්කුති දවසක...’

‘මේ... ගිහිං කුල් වතුර බෝතලයක්වත් අරං වරෙං.. බීලා මෙතනින් මකබෑ වෙන්න.’

හොර බුවා යළිත් ගොස් බෝතල් පෙරළන හඬ ඇසුණි. මඳ වේලාවකින් හොර බුවා ආවේ සංවර්ධනෙක විස්සේ දිනුමක් ඇඳුණා වගේය. අතේ බාගයක් පිරවූ බෝතලයක් විය.

‘මෙන්න මචං කොට කැල්ලක් අහු වුණා. මැන්ස් වතුර බෝතල් අස්සේ ලේබලේ ගලෝලා හංගලා තියලා.’

‘එළ.. යකෝ’. එළ.. වෙලාවෙ හැටියට ගං මෙහාට...’ එය දුටු සැනින් අයියා ගේ තත්ත්වය වෙනස් විය.

දැස් සුපර් සැලුං එකක ක්‍රිස්ටල් ලයිට් වගේ විය. කෙස් කාබන් කූරු මෙන් කෙළින්

විය.

'ම.. ම.. මරල හංගනවා. යකෝ.. ඕකට අත තිබ්බොත්.. අත් කපනවා.. ඔයිට වැඩිය හොඳයි මාව මරාපල්ලා...

අයියා බැමි පිටින් වෙව්ලන්නට විය.

'හෙක් හෙක් හේ... ආ ගහපං මෂං.. කුෂ්ෂියට ගීං බලපං උම්බලකඩ කැල්ලක් වත් තියේද කියලා. සැන්ඩ් නෑ.. අමුවෙං ගහමු...'

හොර බුවා මූඩිය ගලවා බෝතලය කටේ හලා ගන්නට සැරසුණී.

'පට පට.. පටාස්' යන හඬ ඇසුණී. මම විගස හැරී අයියා දෙස බැලුවෙමි. අදහන්නටත් බැරිය.

ඉන්ක්‍රෙඩිබල් හල්ක් යෝධයා මෙන් අයියා සියලු බැමි කඩාගෙන හොර බුවා වෙතට පනින්නට යනු පෙනුණී.

'දූ.. දූවමු මනං.. දූවමු.. මූ.. මූනං යකෙක්.. නයිලෝන් ලණුවත් කඩා ගත්තා... දූවපාං...' හොර බුවාලා දූවන්නට ඉගිළුණහ.

අයියා උන් පසු පස හඹා යන අතර පට පට පටොස්.. හඬ යළිත් ඇසුනි.

එවර බැමි බිඳගෙන නැගී සිටියේ මිසිස් හල්ක් හෙවත් බුවී අක්කාය. 'මටත් හොරා.. මෙතන කොට කැලි හංගන් ඉඳලා.

සැරින් සැරේ තනියම සෙට් වෙලා.

අම්මපා අද මං...' ආවේස වූ ඇය අසළ තිබූ කොස්සද රැගෙන අයියා හඹා යන්නට විය.